සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# භූගෝල විද්‍යාව

08 ශ්‍රේණිය	කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01 සෞරග්‍රහ මණ්ඩලයේ පැවැත්ම රඳාපවතින්නේ .......................................... මත වේ. (වායුව / හයිඩ්‍රජන් / සූර්යයා)

02 සිකුරු ග්‍රහයා ආශ්‍රිතව පවතින ප්‍රධානතම වායුව .......................................... වේ. (ඔක්සිජන් / හයිඩ්‍රජන් / කාබන්ඩයොක්සයිඩ්)

03 සෞරග්‍රහ මණ්ඩලයේ දුරින් පිහිටි ...................................... ග්‍රහයාගේ විශාල කළු ලපයක් දක්නට ඇත. (යුරේනස් / ප්ලූටෝ / නෙප්චූන්)

04 පෘථිවි භ්‍රමණය මත පෘථිවිය ගෝලාකාර වස්තුවක් නිසා ඕස්ට්‍රේලියාවට මධ්‍යම රාත්‍රිය උදාවන විට දකුණු ඇමෙරිකාවට ........................................................................ උදාවේ. (රාත්‍රිය / උදෑසන / මධ්‍යාහ්නය)

05 ග්‍රිනිච් දේශාංශයේ සිට බටහිරට යනවිට දේශාංශ 1 කට .............................. බැගින් වේලාව අඩු වේ. (විනාඩි 2 / විනාඩි 4 / පැය 1)

- අංක 06 - 10 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියා දක්වන්න.

06 ජුනි 21 දින කර්කටක නිවර්තනයට හිරු මුදුන්වන විට උත්තරාර්ධ ගෝලයට ............................................. ඍතුව උදා වේ.

07 කොංගෝ ගංගාව ........................................................................ මහාද්වීපයේ පිහිටා ඇත.

08 මධ්‍යම ආසියාවේ ස්ටෙප්ස් තෘණබිම්වල සිට ............................................... දුර්ගය හරහා පැමිණි ආර්ය ජනයාගෙන් දකුණු ආසියාව ජනාවාස වී තිබේ.

09 කර්මාන්ත ක්ෂේත්‍රය අතින් ...................................................... දකුණු ආසියාවේ අනෙකුත් රටවලට වඩා ඉදිරියෙන් ඇත.

10 හිමාලය කඳු වැටියේ දකුණු පාමුල පිහිටි රටක් ලෙස .................................................. දැක්විය හැකිය.

- අංක 11 - 15 දක්වා වූ ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

11 ලෝකයේ විශාලම ඩෙල්ටාව පිහිටා තිබෙන්නේ ගංගා නම් ගඟ මුහුදට වැටෙන ස්ථානයේ ය. (   )

12 රුපියා මුදල් භාවිතා කරන්නේ මාලදිවයින වේ. (   )

13 පාකිස්ථානයේ පිහිටි චෙරු පුංචි වැඩිම වැසි ලබන ප්‍රදේශයකි. (   )

14 දකුණු ආසියානු කලාපයේ වනාන්තර නොමැති රට භූතානය වේ. (   )

15 දකුණු ආසියාවේ ජෛන ආගම පවතින්නේ ඉන්දියාවේ පමණි. (   )

- අංක 16 - 20 දක්වා වූ ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

16 ලෝකයේ රෙදිපිළි හා බුමුතුරුණු නිෂ්පාදනය අතින් ප්‍රසිද්ධ වී ඇති රට මේවායින් කවරක් ද?

(1) ඉන්දියාව (2) නේපාලය (3) මාලදිවයින (4) පාකිස්තානය

17 ඉවත දමන එළවළු හා ගොම භාවිතා කර නිපදවාගනු ලබන ජීව වායුව බහුලවම ප්‍රයෝජනයට ගන්නේ මින් කවර ප්‍රදේශයක් ආශ්‍රිතව ද?

(1) ඉන්දියාවේ ග්‍රාමීය ප්‍රදේශ (2) පාකිස්ථානයේ ග්‍රාමීය ප්‍රදේශ

(3) නේපාලයේ ඇතැම් ප්‍රදේශ (4) ඇසෑම් ප්‍රදේශයේ

18 කඳුකර ගෝත්‍රික ෂෙර්පා කාන්තාවන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය මින් කුමක් ද?

(1) ලෝහ භාණ්ඩ නිෂ්පාදනය (2) සත්ත්ව පාලනය

(3) සංචාරක කර්මාන්තය (4) වූල් රෙදි විවීම

19 බංග්ලාදේශයේ සුන්දූබාන්ස් වගුරුබිම පාරිසරික ජෛව සුරක්ෂිතයක් මෙන්ම ස්වාභාවිකව වැඩෙන ශාකයකට වාසස්ථාන සපයයි. එම ශාකය නම්

(1) තිරිඟු පැළෑටි (2) කපු පැළෑටි (3) හණ පැළෑටි (4) මී පැළෑටි

20 දකුණු ආසියානු රටවලින් සංචාරක කර්මාන්තය ප්‍රධානතම විදේශ විනිමය උපයන මාධ්‍යය ලෙසින් කටයුතු කරන රට මින් කුමක් ද?


(1) පාකිස්ථානය (2) බංග්ලාදේශය (3) ඉන්දියාව (4) මාලදිවයින

(2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01 8 ශ්‍රේණියේ දී දකුණු ආසියානු රටවල් පිළිබඳව ඔබ කළ කණ්ඩායම් ක්‍රියාකාරකමට අනුව පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(1) සිතියමේ දක්වා තිබෙන දකුණු ආසියාතික රටවල් (අංක 1 - 7 දක්වා) නම් කරන්න. (ල. 03)

(2) 1, 3 හා 4 අංක වලින් දැක්වෙන රටවල කර්මාන්ත එක බැගින් නම් කරන්න. (ල. 03)

(3) අංක 7 න් දැක්වෙන රටෙහි ග්‍රාමීය කර්මාන්ත 2 ක් දක්වන්න. (ල. 02)

(4) අංක 2, 5, 6 යන අක්ෂර වලින් දැක්වෙන රටවල වගා කරන කෘෂි භෝග දෙක බැගින් නම් කරන්න. (ල. 03)

(5) අංක 1 න් දැක්වෙන රටෙහි පවතින භූවිෂමතා ලක්ෂණ පිළිබඳ කෙටි විස්තරයක්

කරන්න. ( ල. 01 )

02 දකුණු ආසියා කලාපයේ දේශගුණය පිළිබඳ සටහනක් පහත දැක්වේ. සුදුසු ලෙස කරුණු දක්වමින් එම වගුව සම්පූර්ණ කරන්න.

| දේශගුණික ලක්ෂණ | රට හෝ ප්‍රදේශය |
|---|---|
| 1. .............................................................. | තාර් ප්‍රදේශය |
| මෝසම් ඍතුවේ අධික වැසි ලබයි. | ඇසෑම් ප්‍රදේශය |
| වසර පුරාම වැසි ඇත. | 2. .............................................................. |
| වර්ෂාවට වඩා වාෂ්පීකරණය වැඩිය. | 3. .............................................................. |
| 4. .............................................................. | හිමාලය ප්‍රදේශය |
| 5. .............................................................. | ශ්‍රී ලංකාව |
| අධික නියඟ ඇතිවේ. | 6. .............................................................. |

(2 x 6 = 12)

● පහත සඳහන් රූප සටහන් උපයෝගී කරගෙන ප්‍රශ්න අංක 03 ට පිළිතුරු සපයන්න.




(1) (2) (3) (4) (5) (6)

03 (1) රූපවලින් දක්වා ඇත්තේ දකුණු ආසියා රටවල ජනතාව වේ. එම ජනයා අයිති රටවල් අංක යොදා නම් කරන්න. (ල. 05)

(2) ඉහත ඔබ දක් වූ රටවලින් හින්දු ආගම, බෞද්ධ ආගම, ඉස්ලාම් ආගම හා ක්‍රිස්තියානි ආගම අදහන රටවල් දෙක බැගින් නම් කරන්න. (ල. 04)

(3) ඉහත රටවල් තුනක සංස්කෘතික වටිනාකමක් ඇති ස්ථාන එක බැගින් දක්වන්න. (ල. 03)




පෘථිවි පෘෂ්ඨය

04 (1) වායුගෝලයේ ස්ථර දක්වෙන රූප සටහනක් මෙහි දක්වා ඇත. එහි 1 සිට 4 දක්වා ඇති වායුගෝලීය ස්ථර නම් කරන්න. (ල. 04)

(2) අංක 1 න් දක්වෙන වායුගෝලීය ස්ථරය මිනිස් කටයුතුවලට බලපාන ආකාරය දක්වීමට කරුණු 2 ක් ලියන්න. (ල. 04)

(3) අංක 2 ස්ථරයෙන් මිනිසාට ලැබෙන

ප්‍රයෝජන 2 ක් ලියන්න. (ල. 02)

(4) වායුගෝලය පිරිසිදුව තබාගැනීමට මිනිසා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග 2 ක් ලියන්න. (ල. 02)

05 (1) පෘථිවියේ පවතින සියලු දේශාංශ රේඛා මධ්‍යාහ්න රේඛා ලෙස සලකන්නේ ඇයි?

(ල. 03)

(2) වේලා කලාපයක් සඳහා භාවිතා වන දේශාංශ ගණන දක්වන්න. (ල . 02)

3. නැගෙනහිර දේශාංශ $30^o$ වේලාව ප.ව. 4.00 නම් වේලාව ප.ව. 6.00 වන්නේ කුමන දේශාංශය ආශ්‍රිතව ද? (ල. 03)

(3) පහත දී ඇති දත්ත අනුව වේලාව ගණනය කරන්න. (ල. 02)

1. ග්‍රිනිච් වේලාව දහවල් 12.00 නම් බටහිර දේශාංශ $80^o$ වේලාව. (ල. 02)

2. බටහිර දේශාංශ $10^o$ වේලාව පෙ.ව. 8.00 නම් බටහිර දේශාංශ $25^o$ වේලාව.

උතුරු අර්ධ ගෝලයට

දකුණු අර්ධගෝලයට

06 (1) පෘථිවි පරිභ්‍රමණය යනු කුමක් ද? (ල. 02)

(2) පෘථිවි පරිභ්‍රමණය නිසා ඇතිවන සිදුවීම් 2 ක් දක්වන්න. (ල. 02)

(3) පෘථිවි පරිභ්‍රමණය නිසා සිදුවන සිදුවීම් අනුව පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න. (ල. 08)

| මාසය | හිරු මුදුන්වන ප්‍රදේශය | ඍතුව |
|---|---|---|
| මාර්තු | 1 ...................................... | j i k ; h |
| මාර්තු | සමකය | 2 ...................................... |
| ජුනි | කර්කටක නිවර්තනය | 3. ...................................... |
| ජුනි | 4. ...................................... | සිසිරය |
| සැප්තැම්බර් | සමකය | 5. ...................................... |
| 6. ...................................... | සමකය | වසන්තය |
| දෙසැම්බර් | මකර | 7. ...................................... |
| දෙසැම්බර් | 8. ...................................... | ගිම්හාන |

07 පහත දක්වෙන්නේ සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝකවල ලක්ෂණ කිහිපයකි. එම ලක්ෂණවලට හිමි ග්‍රහලෝකය ඉදිරියෙන් ලියන්න.

(1) අක්ෂය වටා ගමන් කිරීමට වඩා අඩු කාලයකින් සූර්යයා වටා ගමන් කිරීම

The National e-Learning Portal for The General Education